


ගෙවතු වගා වැඩසටහන
(ජනපද ඉඩම්වල)
ඉඩම් අංශය
ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
හතරලියද්ද

# හැඳින්වීම

- හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල තෝරාගත් වසම් කිහිපයක ජනපද තුළ ගෙවතු වගාවෙහි නිරත වීම සඳහා ජනපදවාසීන් දිරිමත් කිරීම හා එමගින් ආහාර සුරක්ෂිතතාවයට දායක වීම.

- එහිදි තෝරා ගත් එක් එක් වසම්වල ජනපදයන්හි පදිංචිකරුවන් යොදා ගනිමින් ඔවුන්ට තම ගෙවත්ත තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා බීජ බෙදා දීම හා පහත ක්ෂේත්‍රයන්ට අදාළව උපදෙස් ලබා දීම සිදු කිරීම.

  - ආහාර බෝග මඟින් භූමි අලංකරණය
  - කොම්පෝස්ට් නිෂ්පාදනය හා භාවිතය
  - භූමිය හා ඉඩකඩ පරිහරණ ක්‍රම
  - පස සංරක්ෂණය හා පාංශු ඛාදනය වැලැක්වීම.

# <u>ව්‍යාපෘතියේ අරමුණු</u>

- වැඩි වශයෙන් දරිද්‍රතාවයෙන් පෙලෙන හා පාංශු ඛාදනය අධික වශයෙන් සිදුවන අවධානයට ලක් නොවන රජයෙන් ලබා දී ඇති ඉඩම් වල ජීවත් වන ජන කොටසගේ එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය ආහාර භෝග වගාව හා ඒ සම්බන්ධ කාර්යාල නිලධාරින්ගේ දැනුම බෙදා ගැනීම.

- වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය වැඩි කර ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම.

- තම පරිභෝජන අවශ්‍යතා තම ගෙවත්ත තුළම සම්පාදනය කර ගැනීම ඉහළ නැංවීම.

- සීමිත භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම.

- පවුලේ ආහාර අවශ්‍යතාවය සඳහා වැය වන වියදම අවම කිරීම.

- පස සංරක්ෂණය හා භූමි පරිහරණය පිළිබඳව දැනුවත් කිරීම් හා නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම

# ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන වසම් හා ජනපද

- පල්ලේපොල - වැලිකන්ද ජනපදය (පවුල් 18)
- දුංකුඹුර - කුඩුමීරිය ජනපදය (පවුල් 20)
- අලුදෙණිය උතුර - දී ඇල්ල ජනපදය (පවුල් 17)
- ඉඹුලේතැන්න - මිණිගමුව ජනපදය (පවුල් 10)
- පොල්වත්ත - ඇලෝටුව ජනපදය (පවුල් 10)

# ඉලක්කගත කණ්ඩායම

- එක් එක් ජනපදයෙන් තෝරාගත් පවුල් 75 ක් මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලදී

## ❑ සිදුකරන ලද වැඩ වැඩසටහන්

1. දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
   - ❖ කොම්පෝස්ට් නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන් පැවැත්වීම
   - ❖ භූමිය හා ඉඩකඩ පරිහරණ ක්‍රම හඳුන්වා දීම
   - ❖ විවිධ වගා ක්‍රම හඳුන්වාදීම
   - ❖ පස සංරක්ෂණය සිදු කරන ආකාරය හා ඊට අදාල තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම
2. ඉඩම් අංශයේ නිලධාරීගේ මූල්‍යාමය දායකත්වයෙන් බීජ වර්ග කිහිපයක් අඩංගු බීජ කට්ටලයක් ගෙවතුහිමියන් වෙත ලබා දීම.

## පස සංරක්ෂණය සිදු කරන ආකාරය හා ඊට අදාල තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම

## (කුඩුමීරිය ජනපදය)







කොම්පොස්ට් පොහොර සකස් කරන අකාරය පිළිබඳ දැනුවත් කිරීම.
(වැලිකන්ද ජනපදය)






- මිණිගමුව ජනපදය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම





- ඇලෝටුව ජනපදය තුල බීජ ලබාදීම් හා ගෙවතු වගා කටයුතු සිදු කර ඇති අයුරු







# ප්‍රගතිය

- මෙම ව්‍යාපෘතිය සදහා තෝරාගත් ජනපද පහෙන් හදුනාගත් පවුල් 75 තම පරිභෝජනය සදහා අවශ්‍ය එලවළු හා පලාවර්ග තම ගෙවත්තෙන්ම ලබාගැනීම නිසා ඒ සදහා වැය වන මුදල ඉදිරි කර ගැනීම මඟින් එම මුදල් වෙනත් කාර්යයකට යොදා ගැනීමට හැකිවී ඇත.

 උදා:- මෙම පවුල් සදහා සතියකට එලවළු සදහා රු.1500.00 ක් පමණ වැය කරන අතර මාසයක් තුල රු. 6000.00 ක් වන අතර මෙම වැඩසටහන නිසා එම මුදල ඔවුන්ට ඉතිරි කරගත හැකි වී ඇත.

 වර්තමානයේ පවතින දැඩි ආර්ථික අර්බුදය හමුවේ එය ඔවුන්ට මහඟු පිටුවහලක් වී ඇත.

- බෙදා දෙන ලද බීජ ගෙවතු වගාව සඳහා යොදාගෙන ඇති අතර මේ වන විට එමගින් අස්වනු වාර කිහිපයක් ලබාගෙන ඇත.

- නෙලාගන්නා ලද අස්වැන්න එදිනෙදා ගෘහස්ථ පරිභෝජනයට යොදාගෙන ඇත.

- පස සංරක්ෂණය කළ යුතු ස්ථානවල පස සංරක්ෂණය සඳහා දෙන ලද උපදෙස් අනුව සුදුසු තාක්ෂණික ක්‍රම යොදාගෙන ඇත.

  උදා: සැවැන්දරා වැටි සකස් කිරීම

- කුඩුමීරිය ජනපදය තුල ගෙවතු වගා කටයුතු සිදු කර ඇති අයුරු








# පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කරමින් හා ගෙවතු වගාවේ නිරතවී ඇති ආකාරය










- දී ඇල්ල ජනපදය තුල  ගෙවතු වගා කටයුතු සිදු කර ඇති අයුරු


# ඉදිරි සැලසුම්

- තෝරා ගන්නා ලද ආහාර බෝග කීපයකට අදාල බීජ ප්‍රතිලාභීන් සඳහා ඉදිරියේදී බෙදා දීම.
- ගෙවත්ත නිරන්තරව යාවත්කාලීන කිරීම සඳහා එදිනෙදා පරිභෝජනයට ගන්නා ආහාර බෝගවල රෝපණ ද්‍රව්‍ය හා බීජ මගින් නව පැල නිෂ්පාදනයට හුරු කිරීම.
- කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා තවදුරටත් දිරිමත් කිරීම.
- කොට්ඨාශයෙහි අනෙකුත් ජනපද සඳහා ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කිරීම.
- ගෙවතු අධීක්ෂණය හා පසු විපරම් කටයුතු අඛණ්ඩවව සිදු කිරීම.